සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
## ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
## Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ....................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .......................................

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "ස්ථිර අරමුණකින් තොරව කටයුතු කිරීම" යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
 1. ඉඟුරු දී මිරිස් ගත්තා වගේ 2. පරංගියා කෝට්ටේ ගියා වගේ
 3. මඩේ හිට වූ ඉන්න වගේ 4. කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වගේ

02. "කරල පැහුණා" යන ඉඟිවැකියේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
 1. සුහදතාව ඇතිවීම 2. අවාසියක් සිදුවීම 3. කුඹුර සරුවීම 4. වාසියක් සිදුවීම

- 03, 04 ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදුණු පිළිතුර තෝරන්න.

03. 1. සණ්ඨාර 2. සෘණ 3. හිරු කිරණ 4. තෘෂ්ණාව

04. 1. කණ්ණාඩි 2. කණිෂ්ඨ 3. විකිණිණි 4. නිෂ්ඵල

05. බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන      වට
 පැහැදුළ රිවි මඬල සකි පෙනෙය      ත - නෙතට
 ඉහත පද්‍ය පාදවල ඇතුළත් සඤ්ඤක අක්ෂර ගණන තෝරන්න.
 1. 2 කි 2. 3 කි 4. 4 කි. 5. 5 කි.

06. මුලින් යෙදී ඇති උක්ත පදය හා ගැළපෙන අනුක්ත පදය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
 1. කුරුල්ලා - කුරුල්ලන් 2. දැරියක් - දැරියකු 3. ළමෝ - ළමයි 4. ඔවුහු - ඔවුන්

07. මධ්‍යම පුරුෂ ඒකවචන ස්ත්‍රී ලිංග උක්ත පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
 1. තා 2. තී 3. ඈ 4. ඇය

- මුලින් දී ඇති පදයට ගැළපෙන විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

08. ආලෝකය 1. එළිය 2. අලු 3. තිමිර 4. පහන

- මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් නොවන පිළිතුර තෝරන්න.

09. ස්වර්ණ 1. රන් 2. රුවන් 3. කසුන් 4. කාංචන

10. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා හා අවසාන ක්‍රියාව පිළිවෙළින් යෙදුණු වාක්‍යය තෝරන්න.
 1. අපූ පිලට අවුත් තෙමුණු හිස පිසදමමින් දූර්ගාට කථා කළේ ය.
 2. එකෙක් බොරු කථා කියමින් අන්‍යයන් හිනස්සයි.
 3. ඇතැම් ගවයෙක් මඩවගුරු කලඹා කලඹා දුවයි.
 4. සමනලයෝ මල් පඳුරුවලට ළංව අහසේ පියාඹති.

11. පහත දැක්වෙන කමත් බස් වහර හා පොදු වහර වැරදි ලෙස දැක්වෙන පිළිතුර තෝරන්න.
1. සේදැරි කරනවා - ඉක්මන් කරනවා
2. රත්තා බෝ කරනවා - ගිනිමැළ ගහනවා
3. සප්පායම - ආහාර අනුභව කිරීම
4. ඇඹුල පේ කිරීම - උදව්වට වැඩ කරදීම

- සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

12. අභිගුණ්ඨික ජනයා .............................. බසින් නිපදවා ගත් බස් වහරක් භාවිත කරයි.
1. තෙලිඟු 2. සිංහල 3. දෙමළ 4. හින්දි

- පහත වාක්‍යයේ හිස්තැනට සුදුසු ක්‍රියා පදය තෝරන්න.

13. අපි ඊයේ බොහෝ වෙහෙස වී පාඩම් ..............................
1. කරමු 2. කරන්නෙමු 3. කළෙමු 4. කරමි

14. සිවුපද කවියක එක ම අක්ෂරයකින් පද හතර ම අවසන් කරන කාව්‍ය ලක්ෂණය හඳුන්වන්නේ,
1. විරිත ලෙසිනි. 2. තාලය ලෙසිනි. 3. අනුප්‍රාසය ලෙසිනි. 4. එළිවැට ලෙසිනි.

15. "අ" හා "ආ" කොටස්වල ඇති වාක්‍යාංශ සමග තනිපදය ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
A - කෙළෙහි ගුණ නොදන්නා - E බහුශ්‍රැත
B - බොහෝ ඇසූ පිරූ තැන් ඇති - F බහුපා
C - පාද බොහෝ ගණනක් ඇති - H අකෘතඥ
D - දියෙහි හැසිරෙන - G ජලචර
1. A හා E ය. 2. B හා G ය. 3. C හා F ය. 4. D හා H ය.

16. නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පදයක් ඇතුළත් වාක්‍යය තෝරන්න.
1. හැමූ සුළිසුළඟින් උස ගොඩනැගිලි විනාශ විය. 2. නිල් අහසේ තරු රැසක් දර්ශනය විය.
3. දක්ෂ රියදුරා පරිස්සමෙන් රථය ධාවනය කළේ ය. 4. නිවාසභාර ගුරුතුමිය දරුවන් දිරි ගැන්වූවා ය.

17. උපමාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
1. හඳහාමි අප දිහාව එබී බලයි පා හිනාව
2. ඇස පියා ගනී ගස යට වැතිරී ගෙන
3. උතුමන් හද සපිරි කුළුණු මෙත් අඩු නොවී පවතී
4. මගෙ නංගිගෙ පොඩි හිනාව වගේ ය මේ පිච්ච පොකුර

18. අර්ථය වැරදි ලෙස දැක්වෙන පිළිතුර තෝරන්න.
1. උරණ ව - කෝප වී
2. සමාධි ව - සතුටු වී
3. අවශේෂ - ඉතිරි වූ කොටස්
4. පරිශ්‍රය - වෙහෙස

19. විරාම ලක්ෂණ යෙදීම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
1. සීමා දෙකක අන්තරය දැක්වීමේ දී කෙටි ඉර යෙදේ.
2. සංවාදයක් ලියා දැක්වීමේ දී දෙතිත යෙදේ.
3. විකල්පයක් හෝ තේරීමක් දැක්වීමේ දී කෙටි ඉර යොදනු ලැබේ.
4. උපුටා ගත් ප්‍රකාශයක හෝ පාඨයක කර්තෘ දැක්වීමේ දී කෙටි ඉර යෙදේ.

20. පහත දැක්වෙන කෘති අතුරෙන් තුනක් එක් වර්ගයකට අයත් වේ. නොගැළපෙන පිළිතුර තෝරන්න.
1. ප්‍රබන්ධෝපදේශය 2. හිතෝපදේශය 3. නාමාෂ්ට ශතකය 4. ව්‍යාසකාරය

(ලකුණු 2 × 20 = 40යි)

## II කොටස

- 01 හා 02 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයේ දී සකස් කළ බිත්ති පුවත් පත ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ විසින් නිර්මාණය කරන ලද බිත්ති පුවත්පතට යෙදූ මාතෘකාව කුමක් ද? (ලකුණු 02)

ii. ඒ සඳහා යොදා ගත් නිර්මාණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. ක්‍රියාකාරකම ආරම්භයේ දී ම ඒ සඳහා ලැබුණු ගුරු උපදෙස් හතරක් ලියන්න. (ලකුණු 04)

iv. ක්‍රියාකාරකම සඳහා තොරතුරු ලබා ගත් ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

v. මෙම ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16 යි)

02. පහත දී ඇති මාතෘකා අතුරෙන් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු වන සේ රචනාවක් ලියන්න.

i. පොත් කියවමු ලොව ම දකිමු

ii. මහ වැස්සකට මැදි වුණෙමි

iii. මගේ රට මට අගෙයි

iv. ගස් රැකුණොත් අපත් රැකේ

(මුළු ලකුණු 14 යි)

03. ඔබ පාසලේ පරිසර සුමිතුරෝ කණ්ඩායම විසින් මෙවර පැවැත්වීමට සැලසුම් කර ඇති වාර්ෂික පැළ ප්‍රදර්ශනය හා අලෙවිසල සඳහා විවිධ පැළ වර්ග අවශ්‍ය වී ඇත. ඒ සඳහා අවශ්‍ය පැළ වර්ග නම් කර ඒවා ලබා ගැනීමට සහාය දක්වන මෙන් ඉල්ලා බත්තරමුල්ල මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂතුමා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න. ඔබ පරිසර සුමිතුරෝ කණ්ඩායමේ ලේකම් ලෙස කටයුතු කරන සුමියුරු මහවෙලගේ යැයි සිතන්න.

(ලකුණු 10)

04. පෙළපොත ඇසුරෙන් අසා ඇති පහත ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. "වැඩි පමාවක් නැති ව ඔබට ඔබේ කොටස ලැබේවි"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කවරකු ද?

ii. "ඔයා බලාගෙන ඉන්නකෝ දැන් අප්පච්චි මොකද කරන්නේ කියලා"

(අ) මෙම ප්‍රකාශය කරනුයේ කවරකු විසින් ද?

(ආ) මෙහි සඳහන් අප්පච්චිගේ නම ලියන්න.

iii. "ජීවිතයේ අවසාන කාලයේ දී දෙනෙත් අන්ධ වුවත් ලිවීම අත්හැරියේ නෑ"

(අ) මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ කවුරුන් පිළිබඳව ද?

(ආ) මෙය ශ්‍රවණය කළ පිරිස නම් කරන්න.

iv. "පනම් හතක් නම් වැඩියි වෙළෙන්දා"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් නිර්මාණයේ නම ලියන්න.

(ආ) එම නිර්මාණයට පදනම් වී ඇත්තේ කුමන කතාවක් ද?

v. "ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

(ආ) මෙය ශ්‍රවණය කළේ කවුරුන් ද?

(ලකුණු 2 × 5 = 10 යි)

05. පෙළ පොතේ දැක්වෙන පහත පද්‍යවල හිස්තැන් පුරවා සම්පූර්ණ කරන්න.

i. දඟ කරමින් නට නටා
ඇවිදින මුළු ලොව වටා
..........................................
..........................................

ii. සුදෝ සුදු වැ වලාකුළෙනි
..........................................
මඟුලට කළු නො නිසි බැවිනි
..........................................

iii. ජම්බු ගහට රත පොරවන්නී
..........................................
..........................................
ලෝ කත විසිතුරු කරලන්නී

ii. ..........................................
..........................................
ගත ගන රන් රුවෙකි
වනත නත මුත් කවුරු වෙති හැකි

iii. ..........................................
..........................................
මහ රැ මහ සයුරෙන් විත් ලංකා
ඔබ රක්නා දිරි වඩවයි ලංකා

(ලකුණු 2 × 5 = 10 යි)

06. පෙළපොතේ එන පහත දැක්වෙන කෘතිවල කතුවරුන් නම් කරන්න.

i. අඹ යහළුවෝ ..........................................
ii. අක්කර පහ ..........................................
iii. විනිවිදිම් අඳුර ..........................................
iv. මහනුවර ගිවිසුම ..........................................
v. කෝමල රේඛා ..........................................
vi. සඟ රජ වතගොත ..........................................
vii. කියවන නුවණ ..........................................
viii. මාවතේ ගීතය ..........................................
ix. ලෝකෝපකාරය ..........................................
x. මුනිගුණ අලංකාරය ..........................................

(ලකුණු 1 × 10 = 10 යි)

07. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පැරණි හා මධ්‍යතන යුගවල උගත් පුද්ගලයා හැඳින්වීමට බහුශ්‍රැත යන පදය භාවිත විය. එකල දැනුම ලබා ගත්තේ ආචාර්යවරයාට හෝ දේශකයාට හෝ සවන් දීමෙනි. මෙය දැනුම ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගය විය. පන්සල් අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්‍ෂණය වූයේ ගුරුවරයාට මැනවින් සවන් දී පුන පුනා කියවා වනපොත් කිරීම ය. මේ ක්‍රමය ගැන එකල ලියූ බොහෝ ග්‍රන්ථවල සඳහන් වේ. එවකට තිබූ පුස්කොළ පොත්වල පිටප සංඛ්‍යාව අල්ප වූ හෙයින් මේ ක්‍රමය වඩාත් ම අවශ්‍ය විය.

i. පැරණි යුගවල බහුශ්‍රැත යන පදය භාවිත වූයේ කවුරුන් හැඳින්වීමට ද?
ii. එකල දැනුම ලබා ගත්තේ කෙසේ ද?
iii. පන්සල් අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්‍ෂණය වූයේ කුමක් ද?
iv. එම ක්‍රමය වඩාත් ම අවශ්‍ය වූයේ ඇයි?
ix. පහත පදවල අර්ථය ලියන්න.
(අ) අල්ප - .......................................... (ආ) වනපොත් කිරීම - ..........................................

(ලකුණු 2 × 5 = 10 යි)